Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016.11. 22 |

පැමිණිලිකරු : එස්.බී.නිසංසලා මිය,
නො. 24/15, 24 - සී,
දුම්රිය නිල නිවාස,
දුම්රිය පල පාර,
කොළඹ 04.

වගඋත්තරකරු : විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

**පැමිණිලි අංකය : HRC/4718/15**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතු වන එල්.එම්.ලිතුම් ශතිර දරුවා 2016 වසරේ වගඋත්තරකාර විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලදුව සම්මුඛ පරීක්ෂණයට පෙනීසිට ලකුණු 70 ක් ලබාගත් බවත්, පසුව කිසිදු දැනුම්දීමකින් තොරව විදුහල්පතිවරයා විසින් තාවකාලික ලේඛනයෙන් දරුවාගේ නම ඉවත් කර තිබූ බවත්ය. පසුව අභියාචනා පරීක්ෂණයට පෙනීසිටි බවත්, එහි සභාපතිවරයා විසින් පාසැලේ විදුහල්පතිවරයාගේ තීරණ සම්බන්ධයෙන් තමන්ට විරුද්ධ විය නොහැකි බවට පැවසූ බවත්ය. එබැවින් සිදුවූ අසාධාරණයන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වගඋත්තරකාර විද්‍යාලයෙහි පළමු ශ්‍රේණියට තම දරුවා ඇතුලත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පැමිණිලිකාරියගේ දරුවා වන එල්.එම්.ලිතුම් ශතිර 2016 වර්ෂය සඳහා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරීම පිණිස "ආසන්නතාව" පදනම යටතේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, එම අයදුම්පත සමග පදිංචිය සනාථ කිරීම සඳහා පැමිණිලිකරු විසින්



| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 165,කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08. | සභාපති / தவிசாளர் / Chairman | 011-2696470 |
| ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2696470 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrc@sltnet.lk |
| දුරකථන / தொலைபேசி | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම් / செயலாளர் / Secretary | 011-2689558 |
| ක්ෂණික / துரித அழைப்பு / Hotline | 011-2689558, 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

ඉදිරිපත් කර ඇත්තේ බම්බලපිටිය, නො. 24/15 දරණ ස්ථානයේ පිහිටි සිය පියාට අයත් දුම්රිය නිල නිවසට අදාළ ලේඛණ බවත් කියාසිටි. අංක : 23/2013 චක්‍රලේඛයෙහි 6:1(1) හි සඳහන් ප්‍රතිපාදන මත යම් අයදුම්කරුවෙකු/ කාරියක නිල නිවසක පදිංචිවී සිටී නම් ඔහු හෝ ඇය පදිංචි ස්ථානය ලෙස රජයේ නිල නිවාසය පිළිගත හැකි වුවත්, පැමිණිලිකාරියගේ පියාගේ නිල නිවාසය පැමිණිලිකාරියගේ පදිංචි ස්ථානය ලෙස පිළිගත නොහැකි බවත් ඒ අනුව අදාළ චක්‍රලේඛය පරිදි කටයුතු කර ඇති බවත් සඳහන් කර ඇත.

තවදුරටත් වගඋත්තරකරු කරුණු දක්වා සිටින්නේ, පැමිණිලිකාරිය සහ ඇයගේ ස්වාමි පුරුෂයාගේ හැඳුනුම්පත් දෙකම 2014.12.31 දාතම යටතේ 24/15, 24 - සී, දුම්රිය නිල නිවාස, දුම්රියපළ පාර, බම්බලපිටිය, කොළඹ 04 යන ලිපිනයට සකස් කරගෙන ඇති බවත්, එය ඔවුන් සිය දරුවා රාජකීය විද්‍යාලයට ඇතුලත් කර ගැනීමේ අරමුණින්ම සකස් කරගෙන ඇති බවත්ය. තවද, පදිංචිය තහවුරු කර ගැනීම සඳහා. අයදුම්කරුගේ වැටුප් ලේඛනය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරන ලෙස කැඳවීම් ලිපියෙන් දැන්වූ බව ද වගඋත්තරකරු සඳහන් කර ඇත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරුගේ දරුවා ආසන්නතාවය පදනම යටතේ වගඋත්තරකාර විද්‍යාලයට අයදුම් කර ඇති අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනීසිට ලකුණු 70 ක් ලබාගෙන ඇත. එය ආසන්නතාවය සඳහා ලකුණු 35 ක් ද, ඡන්ද හිමිකම සඳහා ලකුණු 35 ක් ද වශයෙනි.

පැමිණිලිකාරියගේ පියා වන හේමචන්ද්‍ර මහතා සේවා අංක : 2520 යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන අතර, 2004.09.21 දිනැතිව ඔහු වෙත නිල නිවසක් පවරා ඇති අතර, පැමිණිලිකාරිය ඇයගේ ස්වාමිපුරුෂයා සහ දරුවන් දෙදෙනා එහි ජීවත් වන බව නිරීක්ෂණය වේ. 2008.04.08 දින දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (මා/කා) වෙනුවට නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු (ගොඩනැගිලි) විසින් පැමිණිලිකාරියගේ පියා වෙත යොමුකළ ලිපිය අනුව අංක : 24/15 ලිපිනයට අදාළ නිල නිවසේ ඔහු සමඟ ජීවත්වීමට තම විවාහක දියණිය (පැමිණිලිකාරිය) සහ ඇයගේ ස්වාමිපුරුෂයාට අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව පැමිණිලිකාරිය තම ස්වාමිපුරුෂයා සහ දරුවන් සමඟ එම නිල නිවසෙහි ජීවත් වන බව තහවුරු වේ.

එසේම ආසන්න වර්ෂ පහක කාලය සඳහා ඡන්ද හිමිකම සහ වෙනත් ලේඛන මගින් ද පැමිණිලිකාරියගේ සහ ඇයගේ ස්වාමි පුරුෂයාගේ පදිංචිය සනාථ වේ.

ඒ අනුව ඉහත කී සියළු ලේඛනගත සාධක තිබියදී පැමිණිලිකාරිය අදාල ලිපිනයෙහි පදිංචිව නොමැති බවට වගඋත්තර පාර්ශවය විසින් කුමන තිර්ණායක මත තීරණය කලේද යන්න ගැටළු සහගතය, මෙම කරුණු අනුව සම්මුඛ පරීක්ෂණයේදී ආසන්නතාවය යටතේ ලබාදුන් ලකුණු 70 කිසිදු දැනුම්දීමකින් තොරව ලකුණු 00 බවට පත් කිරීම වගඋත්තරකරුවන් විසින් අත්තනෝමතිකව ක්‍රියා කිරීමකි. ඒ අනුව රාජකීය විද්‍යාලයේ 2016 වසරේ පළමු වසරට සිසුන් ඇතුලත් කර ගන්නා ලද කඩඉම් ලකුණු මට්ටම ලකුණු 66 ක් වන අතර, ලකුණු 70 ක් ලැබූ පැමිණිලිකාරිගේ දරුවා පාසැලට ඇතුලත් වීමට සුදුසුකම් ලබා ඇත.

මේ අනුව සියළු සුදුසුකම් සපුරා තිබියදී අදාල දරුවාට අවස්ථාව ලබානොදීම තුලින් 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ සුරක්ෂිත මූලික අයිතිවාසිකම් යටතේ 12 (1) ව්‍යවස්ථාව අනුව සමානාත්මතාවයේ අයිතිය පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා වන එල්.එම්.ලිතුම් ශනිර දරුවාව වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලයේ 2016 වර්ෂයේ පළමු ශ්‍රේණියේ සමාන්තර පන්තියකට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.12.22 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත : ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.
- අවශ්‍ය පියවර ගැනීම සඳහා

ස/-

**Commissioner**
**Human Rights Commission of Sri Lanka**
**No. 165, Kynsey Road,**
**Colombo 08.**

**Commissioner**
**Human Rights Commission of Sri Lanka**
**No. 165, Kynsey Road,**
**Colombo 08.**